**තඹලගමුව ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 27 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 නොවැම්බර් 23 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට තඹලගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරණ ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව්කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අයත් රු. 7,650,000 ක් වටිනා මෝටර් රථයක් සභාවේ වත්කමක් වශයෙන් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ආ) ලේඛනය අනුව 2015 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවියයුතු තැන්පත්වල වටිනාකම රු. 510,303 ක් වූවද, මෙම ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු. 837,052 ක් ලෙස දැක්වීමෙන් ආපසු ගෙවියයුතු තැන්පත්වල වටිනාකම රු. 326,749 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ලෙජරය අනුව 2015 දෙසැම්බර් 31 දිනට උත්සව අත්තිකාරම් ගිණුම් ශේෂය රු. 128,750 ක් වූවද මූල්‍ය ප්‍රකාශනය අනුව, මෙම ශේෂය රු. 155,000 ක් ලෙස දක්වා තිබීමෙන් උත්සව අත්තිකාරම් ශේෂය රු. 26,250 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.3 ලේඛනමය සාක්ෂි නොමැතිවීම

රු. 53,684,419 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි, පිරියත, මෝටර් වාහන සහ කරත්ත සහ ලීබඩු වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.4 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහය | |
| (i) පරිච්ඡේදය I රීති 5(12) | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් කිරීම් නිලධාරින් තිදෙනෙකුට පරිපාලනමය වශයෙන් භාරදී තිබුණද ඒ අයගෙන ආරක්ෂක ඇප මුදල් ලබා නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය X රීති 193 | වර්ෂයේ තත්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධ විස්තර අයවැය ඇස්තමේන්තු සමඟ සසඳා විචලනයන් සඳහා හේතුන් ඇතුලත් කළ ප්‍රකාශයන් සකස්කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්තිය 134(1) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන ජංගම නොවන දේපල හඳුනාගෙන එහි වටිනාකම් තක්සේරුකර වරිපනම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ මෙහෙයුම්වලින් රු. 438,752 ක් පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායමක් ලබා තිබූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වලින් රු. 2,557,015 ක ආදායම් ඉක්මවූ වියදමක් වී තිබුණි.

### 2.2 මුද්දර ගාස්තු

2013 වර්ෂයේ සිට 2015 වර්ෂයේ මාර්තු මාසය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු. 248,534 ක මුද්දර ගාස්තු ප්‍රමාණය ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුරනැගුම වැඩසටහනේ මුදල් ප්‍රතිපාදන යටතේ එක් ක්‍රීඩාංගනයක් නවීකරණය කිරීමේ වැඩ සියල්ල නිසි ලෙස සම්පූර්ණ කර ඇතිබව කාර්මික නිලධාරි විසින් නිර්දේශ කර රු. 3,345,139 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණද වර්ණ ආලේප කිරීම සහ වතුර ටැංකිය සවිකිරීම යන ඉටුනොකළ වැඩකොටස් සඳහා රු. 191,875 ක් ගෙවා තිබුණි.

(ආ) පළාත් නිෂ්චිත සංවර්ධන ආධාර යටතේ රු. 790,460 ක් වියදමින් වාහන අංගනය වටේ තාප්ප ඉදිකිරීම් සම්බන්ධයෙන් Plinth Plastering කර ඇතිබව කාර්මික නිලධාරි විසින් සහතික කර රු. 59,400 ක් ගෙවීම් කර තිබුණද, 2016 අගෝස්තු 25 දිනට මෙම කාර්මාන්තය සම්පූර්ණයෙන් නිම කර නොතිබුණි. තවද, ඉදිකර තිබූ තාප්පයේ දෙපැත්ත වර්ග මීටර් $300m^2$ වර්ණ ආලේප කර ඇති බව කාර්මික නිලධාරි විසින් සහතිකකර රු. 128,400 ක් ගෙවා තිබුණද, විගණන පරීක්ෂණයේදී වර්ග මීටර් 140 $m^2$ ප්‍රමාණයක් පමණක් වර්ණ ආලේප කර තිබූ බව නිරීක්ෂණය විය. මෙසේ වර්ණ ආලේප නොකර වර්ග මීටර් 160 $m^2$ ක් සඳහා රු. 68,480 ක් මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

තවද, ඉදිකරන ලද වර්ග මීටර් 300 $m^2$ ප්‍රමාණය තාප්පයේ වර්ග මීටර් 162.6 $m^2$ වර්ග ප්‍රමාණයට පමණක් තීන්ත ආලේපකර තිබුණද වර්ණ ආලේප නොකරන ලද වර්ග මීටර් 437 $m^2$ ක ප්‍රමාණය ආලේප කළ බව කාර්මික නිලධාරි සහතික කර රු. 109,687 ක් ගෙවීම් කර තිබුණි. ඒ හේතුවෙන් වර්ග මීටර් 274.4 $m^2$ ක් වෙනුවෙන් රු. 68,875 ක් වැඩිපුර ගෙවීමක් කර තිබුණු අතර තාප්පයේ අඩිතාලම දෙපැත්තම පස් පුරවා පීඩන යන්ත්‍රයකින් තදකිරීම සඳහා රු. 4,375 ක් ගෙවා තිබුණද, එම කර්මාන්තය සම්පූර්ණයෙන්ම නිමකර නොතිබුණි.

**3.2 කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ ජූලි මාසයේ කොන්ත්‍රාත් නොදිය යුතු අයගේ ලැයිස්තුවට ඇතුලත් කරන ලද එක් ප්‍රජාමූල මධ්‍යස්ථානයකට සභාව විසින් 2015 වර්ෂයේ දෙසැම්බර් මස රු. 399,608 වටිනාකමට කොන්ත්‍රාත් ලබා දී තිබුණි.

(ආ) වෙනත් ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ වාහන 05 ක් පසුගිය වර්ෂ දෙකක කාලයක් ධාවනයේ යොදවා තිබුණද, එම වාහන සභාවේ නමට පවරා ගැනීමට 2016 අගෝස්තු 25 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 සහ 2014 වර්ෂවලදී සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ලද කුවිතාන්සි පොත් 09 ක් අස්ථාන ගතවී තිබුණි. අස්ථානගතවූ එම පොත් සඳහා වගකිය යුත්තේ සභාවේ හිටපු ලේකම් සහ සේවකයින් 05 දෙනෙකු ඔවුන් එයට වගකිය යුතු බවත් එහි පාඩුව ඔවුන් ගෙවන බවත් 2015 පෙබරවාරි 17 වන දින ලිපියක් මගින් පිළිගෙන 2016 පෙබරවාරි 08 වන දින කුවිතාන්සි පොත් 02 ක් සඳහා රු. 160,900 ක් ගෙවා තිබුණි. කෙසේවුවද, නැගෙනහිර පළාත් සභා මූල්‍ය රීති 71.3 අනුව අදාල නිලධාරියාට එරෙහිව විනයානුකූල පරීක්ෂණ පවත්වා නොතිබුණි.

(ඈ) කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් රු. 11,999,424 ක මුදලින් රු. 11,874,944 ක ණය මුදල සහ අදාල පොලී මුදල රු. 2,451,384 ක් සභාව විසින් මෙතෙක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 පාරිසරික ගැටළු

සභාව විසින් බල ප්‍රදේශයේ එකතු කරනු ලබන කසල සහ අපද්‍රව්‍ය නුවර පාරට නුදුරු කැලෑ ප්‍රදේශය කට ගොඩකරනු ලබන බැවින් එහි සිටින අලි සහ අනෙකුත් සකුන්ට බාධාවක් වී තිබූ අතර පරිසර දූෂණය වීමටද ඉඩ තිබුණි.

## 3.4 ආර්ථික නොවූ ගනුදෙනු

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන චක්‍රලේඛයේ 4.1 වගන්තිය අනුව පළාත් පාලන ආයතනවල අනියම් හා තාවකාලික පදනම් යටතේ පත්කරන ලද සේවකයන් වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. එසේ වුවද, මෙයට පටහැනිව සභාවේ සේවය කළ සේවකයින් වෙනුවෙන් රාජ්‍ය සේවා අරමුදල වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවා තිබුණි. සේවකයන් 02 දෙනෙකු වෙනුවෙන් 2012 ජනවාරි සිට 2014 අප්‍රේල් දක්වා සේවක භාරකර අරමුදලේ දායක මුදල් නිශ්චිත කාලවලදී ගෙවා නොතිබීමෙන් එම අරමුදලට දඩ මුදල් වශයෙන් රු. 40,919 ක් ගෙවා තිබුණි.

## 3.5 නිෂ්ක්‍රිය වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු මොටර් බයිසිකල් 02 ක් අළුත්වැඩියා කර පාවිච්චි කිරීමට කටයුතු නොකර වර්ෂ 02 ක කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) සභාව සතුව පවතින තම්පලාගම පොළ ගොඩනැගිල්ල රු. 531,996 ක් වියදමින් 2015 දෙසැම්බර් 23 දී අළුත්වැඩියා කර තිබුණද 2016 අගෝස්තු 24 දිනය දක්වා මෙම ගොඩනැගිල්ල අදාල කාර්ය සඳහා යොදවාගෙන නොතිබුණි.

## 4 මානව සම්පත් කළමනාකරණය

2015 දෙසැම්බර් 31 දිනට වූ අනුමත සේවක සංඛ්‍යාව සහ තත්‍ය සේවක සංඛ්‍යාව සම්බන්ධ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යා | තත්‍ය සේවක සංඛ්‍යා | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 01 | 01 | - | - |
| සහායක | 18 | 16 | 02 | - |
| සුළුසේවක | 28 | 40 | - | 12 |
| එකතුව | 47 | 57 | 02 | 12 |

සහායක තනතුරේ පුරප්පාඩු 02 වර්ෂ හතරක සිට පිරවීමට කටයුතු කර නොතිබුණි.

**5 පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

| **පද්ධතිය** | **නිරීක්ෂණය** |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. |
| (ආ) කොන්ත්‍රාත් පාලනය | (i) කොන්ත්‍රාත් පිරිනැමීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි.<br>(ii) ප්‍රජා මූල මධ්‍යස්ථානවල කොන්ත්‍රාත් ලබාදීමේදී මුදල් කොමිසමේ චක්‍රලේඛය අනුගමනය කර නොතිබුණි. |